සහස්‍ර ප්‍රවණතා

# නළ දරුවෝ, ක්ලෝන සහ රති සුවයේ අනාගතය

සියලු ම සත්ව වර්ග විවිධාකාරයෙන් මෙම කාරියෙහි යෙදෙති. එමගින් තම වර්ගයා බෝ කරති. එහෙත් 1978 වර්ෂයේ දී සිදුවූ ලුවී බ්‍රවුන් නම් ප්‍රථම නළ දරුවාගේ උපතින් පසු දහස් සංඛ්‍යාත මිනිස් පිළිසිඳ ගැනීම් යහනෙහි නොව රසායනාගාරවල වීදුරු භාණ්ඩ තුළ සිදුවී තිබේ.

● සරත් රණවීර විසිනි

**සියලු ම සත්ව වර්ග එම කාර්යයෙහි යෙදෙති. මනුෂ්‍යයෝ ද මහත් අභිරුචියෙන් එය කරති. එහෙත් වසර දෙදහසේ මුල් කාර්තුව වනවිට, එකී ලෝකාස්වාද රතිය නම් කටයුත්තේ අරමුණ බෙහෙවින් වෙනස් ස්වරූපයක් ගන්නවා ඇත. එනම් මෙතෙක් කල් සිදුවූවාක් මෙන් දරුවන් ලැබීමේ අභිලාශයෙන් නොව හුදෙක් විනෝදාස්වාදනය සඳහා ම එහි නිරත වීම යි. ඒ වනවිට මෙය එතරම් අවශ්‍ය කාරියක් නොවනු ඇතැයි විද්වද්හු කියති. විශේෂයෙන් ම පොහොසත් හා උන්නතිකාමී බොහෝ මනුෂ්‍යයන් සිය ජාන යොදාගෙන තමන්ගේ ම අනුරූ තනනු පිණිස එම කාරිය අත්හැර නළ දරුවන් ලබා ගැනීමට උනන්දු වනවා ඇත. මේ නළ දරු විප්ලවය ඇසුරෙන් මතුවන ප්‍රශ්න කවරේ ද?**

සියලු ම සත්ව වර්ග විවිධාකාරයෙන් මෙම කාරියෙහි යෙදෙති. එමගින් තම වර්ගයා බෝ කරති. එහෙත් 1978 වර්ෂයේ දී සිදුවූ ලුවී බ්‍රවුන් නම් ප්‍රථම නළ දරුවාගේ උපතින් පසු දහස් සංඛ්‍යාත මිනිස් පිළිසිඳ ගැනීම් යහනෙහි නොව රසායනාගාරවල වීදුරු භාණ්ඩ තුළ සිදුවී තිබේ.

ක්ලෝනීකරණයෙන් ඩොලී නම් බැටළු පැටවා බිහි කිරීමත් සමග ඒ ආකාරයෙන් ම මිනිස් දරුවන් බිහි කළ නොහැකි ද? යන ප්‍රශ්නය මතුවිය. එසේ කළහැකි යයි බලවත් මතයක් ඇතද දෙදහසේ මුල් කාර්තුව අවසන් වන විට වත් එය පහසු දෙයක් වෙතියි බොහෝ අය නොසිතති. කවද හෝ එසේ කරන විට සිදුවන්නේ ඔබගේ සිරුරෙන් ඇබිත්තක් කපා එයින් වෙනත් පුද්ගලයකු තැනීම යි. එවිට ඔබ අල කැබැලි හෝ අතු කැබැලි මගින් බෝකර ගන්නා ඉහුරු හෝ රෝස ශාකයක තත්ත්වයට ඉබේ ම පත්වෙනවා ඇත.

මේ හැරුණු විට මිනිස් කලලයන් නිවාරණය (Screening) හෝ ජානමය වශයෙන් මෙහෙයවීම (genetic engineering) මගින් වැඩිදියුණු කිරීමත්, අනතුරුව ඒවා නළ තුළ සංසේචනය කොට ක්ලෝනීකරණය කිරීමත් ඒ වන විට විකල්පයක් නොව අවශ්‍යතාවක් බවට පත්විය හැක. හැම අතින් ම එවැන්නක වියදම දැරිය හැකි අය අතර එය වෙසෙසින් ම ප්‍රචලිත වනු නිසැක ය.


අප ලිංගික සංසර්ගය හා ප්‍රජනනය දික්කසාද කොට අවසාන යි. 1960 වර්ෂයේ නිපදවන ලද උපත් පාලන පෙත්ත නිසා දරුවන් ලැබීමේ අතුරු ප්‍රතිඵලය නොමැතිව ලිංගික සතුට විඳීමේ වරය කාන්තාවන්ට ලැබිණ. සමලිංගික සේවනය ඉවැසීම නිසා ප්‍රජනන කාරියෙන් තොර වින්දනය සමාජය විසින් අනුමත කළ බවක් පළවිය. මේ නැමියාවන් අලුත් සේ අපට හැඟුන ද සත්ව වර්ගයාගේ වසර මිලියන ගණනක ඉතිහාසය පුරාම පැවැතුණ දේ ය. බොහෝ ක්ෂීරපායී සත්තු සිය සංසර්ග කාලය තුළ හැර අන් කාලවල ලිංගික ක්‍රියාවෙහි නොයෙදෙති. එහෙත් මනුෂ්‍යයෝ සතුන්ගෙන් මෑත්වී විශේෂයක් ලෙස පරිණාමය වූ තැන් පටන් අර සත්ව ගතිය වෙනස් කළහ. ඇවැසි උත්තේජනය ඇතොත් කවර වේලාවක වුව එම කාර්යයේ යෙදීමට ඔවුන්ට හැකියාව තිබේ.

ප්‍රජනනයෙන් තොර වූ වින්දනය සඳහා ම කෙරෙන සාමාජික සංසර්ගය සත්ව වර්ග කීපයක් අතර ඇත. ඩොල්පින්හු, බොනෝනෝ ඒප්පයන් සහ පක්ෂි වර්ග රැසක් ඊට නිදසුන් කළ හැක. මිනිසා ද දැන් ඒ ගණයට ඇතුළත් ව සිටී. වඳ බව ප්‍රචලිත වන නවත් ලක්ෂණයක් දැන් පහළ වී තිබේ. එනම් නළ දරුවන් වශයෙන් බිහි වූ අය ස්වාභාවයෙන් ම වඳ බව උරුම කොට ගැනීමයි. දෙමාපියන් තම වඳ බව නිසා නළ දරු ක්‍රමය භාවිත කළේ නම්, ඒ දරුවාට ද දෙමාපියන්ගේ ජානමය වඳ බව උරුම වේ. නළ දරු උපත් සංඛ්‍යාව ඉහළ යත් ම වඳ බව ද ඉහළ යන බැවි ඉන් පැහැදිලි ය. සමලිංගික සේවනය, රෝගාබාධ වලින් හා ප්‍රවේණි දුර්වලතා වලින් තොර උස් හුරුබුහුටි පියකරු හා සවිමත් දරුවන් ලැබීම වැනි පෞද්ගලික වූ අභිරුචීන් බලවත් වීම යන හේතු නිසා ද, අනාගතයේ සංසර්ගයෙන් තොර ප්‍රජනනය ප්‍රචලිත වනු ඇත.

වත්මන් සමාජයේ සාම්ප්‍රදායික කරදරකාරී විඳුවන ක්‍රම වලින් බැහැරව ලිංගික ආස්වාදය සහ මාතෘ / පිතෘත්වය ලැබිය හැකි මං තිබේ. ඇතැම් නිළියන් සහ නිරූපිකාවන් තම රූ සපුව වැහැරී යන නිසා දරුවන් වැදීම හා හැදීම මග හැර දරුවන් හදා ගැනීම (adoption) කරති. ඒ ආකාරයෙන් ම කුලියට ලබාගත් ගර්භාෂයක වැඩුණු ක්ලෝනයක් හදා වඩා ගැනීමේ අභිරුචිය ද අනාගත මිනිස් සමාජයේ බලවත් විය හැකි යි.

ක්ලෝනීකරණයට එරෙහිව දැනට හැම අංශයකින් ම එල්ල වන විරෝධතා ඉහිල්ව ගිය පසු අඹුසැමියන් ජාන සකසා ලූ දරුවකු අපට ලබා දෙන්න යනුවෙන් පෙරැත්ත කරන දිනය දුර නොවේ. එයත් මනුෂ්‍ය වර්ගයාට නිරෝගී සුරූපී අංග සම්පූර්ණ විශේෂයක් විය හැකි යි. කොයි හැටි වේවා ජානමය වශයෙන් වෙනස් කරන ලද තක්කාලිවලට විරෝධය පළකරන මිනිස් සමාජය ජානමය වශයෙන් වෙනස් කරන ලද මනුෂ්‍යයන්ට විරෝධය පළ නොකරති යි සිතිය නොහැකි ය.

මිනිස් ක්ලෝනීකරණය හා නිර්මාණය කරන ලද දරුවන් හදා වඩා ගැනීම ඉතා නුදුරු අනාගතයේ ම සිදු වෙතැයි විද්වද්හු නොකියති. ගොවිපොළක සතුන්ට එය ප්‍රවේසම් සහිත සාර්ථක ක්‍රමයක් විය හැක. එහෙත් මනුෂ්‍යයන් කෙරෙහි එය යොදා ගැනීම දේශපාලනමය සදාචාරමය



ආගමික හා තවත් මෙකී නොකී හේතු සමූහයක බාධාවන් නිසා තව බොහෝ ඈතට යනු ඇත. දැනටමත් ලොව ආණ්ඩු කිපයක් එය සපුරා තහනම් කොට තිබේ.

අපි ජෛව ලෝකය දෙස බලමු. එහි ක්ලෝනකරණය ස්වභාවයෙන් ම සිදුවන සත්ව හා ශාක විශේෂ ඇත. ඩැන්ඩිලියන් හා විප්ටේල් උරගයන් ප්‍රජනනය වන්නේ රසායනාරයෙනි. කුඩිති (aphids) වර්ග සහ ස්ට්‍රෝබෙරි ලිංගිකතාව හා ක්ලෝනීකරණය අතර අපූරුවට සීරු මාරු වෙති. ක්ලෝනීකරණය වූ මේ සුවිශේෂ වර්ග අන්‍ය වර්ග පසුබස්වා ප්‍රමුඛතාව ලබා නොගන්නේ ඇයි? මීට පිළිතුරු දෙකක් තිබේ. පළමුවැන්න කියන්නේ ලිංගික ප්‍රජනනයෙන් තොරව බිහිවූ වර්ග පරපෝෂිතයන්ට පහසු ගොදුරු වන බව යි. දෙවැන්නෙන් කියැවෙන්නේ ලිංගික සංසර්ගය නිසා ජාන කලවම් වී, ජාන විකෘතීන් ඇතිවීමට තිබෙන ඉඩ අඩු කරන බව යි.

මෙබඳු තර්ක විතර්ක හා පුරෝකථන ආදියෙන් අප කලබල විය යුතු නැත. අපේ ඊළඟ පරම්පාරාව ක්ලෝනීකරණයෙන් ම නිර්මාණය වෙතැයි සිතීම හිස් සිතිවිල්ලකි. 1930 වර්ෂයේ දී නල දරු බිහිවීම ගැන පුරෝකථනය කළ ජාන විද්වද්හු (geneticists) එවිට බොහෝ අය ලෙනින් වැනියන් තම දරුවන්ගේ පියා ලෙස තෝරා ගනිති යි කීහ. අද ඒ විද්වතුන් කී දේ සැබෑවී තිබේ ද? අනාගත පුරෝකථනයන් හි දී මහ වියතුනට පවා වැරදිය හැක. මිනිස් වර්ගයා තුළ ජාන විකෘතීන් (genetic mutations) සිදුවන බව සැබෑ ය. එහෙත් මුළු අනාගත පරම්පරාව ම ජාන විකෘතීන් නිසා සුවිශේෂ අය වේද, නොඑසේ නම් ආබාධිත වූ අය වේද? නැත මන්ද එය සිදුවන්නේ ඉතාමත් සෙමින් බැවිනි.

ලිංගික සංසර්ගය ජානමය වශයෙන් අනවශ්‍ය වෙතැයි අපි සිතමු. එහෙත් එය කිසිසේත් ම ශක්තිය අපතේ යාමක් වන්නේ නැත. ස්වභාව ධර්මය තුළ අප රස විඳිනා සංගීත කලා සාහිත්‍ය ආදී බොහෝ දේ සංසර්ගය හා බැඳී ඇත. ලොව පහළ වූ මහා කාව්‍ය නාට්‍ය ප්‍රබන්ධ කථා සිතුවම් හා සංගීත රචනා මෙම ලෝකාස්වාදරති ශෘංගාරය උත්තරීකරණයේ (subhimation) ප්‍රතිඵල නොවේ ද? උදෑසනක ඔබේ ගෙවත්ත පුරා ඇසෙන කුරුල්ලන්ගේ කිචි බිචි රාවය ලිංගික නරගයක ප්‍රතිඵලය යි. මොනර නැටුම හා පාරාදිස කුරුලු රැඟුම ලෝකාස්වාද රතියට සැරසීමේ ප්‍රතිඵල යි. මෙකී රතිය මිනිස් ජීවිතය පුරා ම ඔහුගේ විවිධාකාර කටයුතු කෙරෙහි බලපායි. එම කටයුතු විනිවිද දකින්නකුට ඒ හැම මනාව දර්ශනය වෙයි. ෂාජහාන් ටජ්මහලය ගොඩ නංවූයේ කා නිසා ද?

ස්ත්‍රීන් නොමැති නම් මේ ලෝකයේ ඇති සියලුම ධනස්කන්ධය අර්ථ ශූන්‍ය වෙයි. වරක් ඇරිස්ටෝටල් ඔනාසිස් කීවේය. "බලය මහාම කාමෝද්දීපකයයි." හෙන්රි කිසිංගර් කියා ඇත. ලිංගික සංසර්ගය නොමැති නම් මනුෂ්‍යයන් කොහිද? මිනිස් ශිෂ්ටාචාරයක් කොයින් ද ? මිනිස් සංස්කෘතියක් පිළිබඳ ව අප කථා කරන්නේ කෙසේ ද?

(ටයිම් ඇසුරෙණි)